# Inorganic Chemistry MCQ
## අකාබනික රසායනය බහුවරණ



01. මෙම කුමන ද්‍රව්‍ය රත්කළ විට එකම වායුමය ඵලය ලෙස $CO_2$ පිටකරයිද?

1. $ZnCO_3$   2. $Ag_2CO_3$   3. $(NH_4)_2CO_3$   4. $Na_2CO_3.10H_2O$   5. $KHCO_3$

02. X නමැති අකාබනික සංයෝගය තනුක $H_2SO_4$ හි සම්පූර්නයෙන් ද්‍රාවණය වෙමින් දුඹුරු පැහැති වායුවක් ලබා දෙයි. මින් ලැබෙන ද්‍රාවණය පහන් සිලු පරීක්ෂාවේදී කොළ පැහැයක් ඇති කරයි. X වීමට වඩාත්ම ඉඩ ඇත්තේ මින් කුමක් ද?

1. $BaBr_2$   2. $Ba(NO_2)_2$   3. $Cu(NO_3)_2$   4. $CuBr_2$   5. $Cu(NO_2)_2$

03. $Mg(NO_3)_2$ සහ $Ba(NO_3)_2$ එකිනෙකින් වෙන්කර හඳුනා ගැනීම සඳහා මින් කුමක් උපයෝගී කරගත හැකිද?

1. ජලීය $Na_2CO_3$   2. ජලීය $NaHCO_3$   3. ජලීය $NH_3$   4. ජලීය KI   5. ඉහත කිසිවක් නොවේ

04. එක්තරා ඇමෝනියම් ලවණයක්, ජලය සහ වායුවක් එකම ඵල ලෙස ලබා දෙමින්, පූර්ණ තාප වියෝජනයට භාජනය වේ. මුක්ත වන වායුව නයිට්‍රජන් හෝ ඇමෝනියා හෝ නොවේ. ඇමෝනියා ලවණයේ ඇනායනය වන්නේ,

1. $SO_4^{2-}$   2. $NO_3^-$   3. $Cr_2O_7^{2-}$   4. $NO_2^-$   5. $CO_2^{2-}$

05. පහත දැක්වෙන සංයෝග අතරෙන් කුමක් ආම්ලික ජලීය මාධ්‍යයේදී $H_2S$ සමඟ ප්‍රතික්‍රියා කර, ඵලවලින් එකක් ලෙස සල්ෆර් නොසාදයිද?

1. $FeCl_3$   2. $Na_3AsO_4$   3. $NaAsO_2$   4. $K_2CrO_4$   5. $Na_2SO_3$

06. ජලීය සෝඩියම් හයිඩ්‍රොක්සයිඩ් භාවිත කරමින් පහත සඳහන් කැටායන යුගලවලින් කුමන යුගලයේ කැටායන එකිනෙකින් වෙන්කර ගත හැකි ද?

1. $Al^{3+}$ සහ $Zn^{2+}$   2. $Ni^{2+}$ සහ $Cu^{2+}$   3. $Cd^{2+}$ සහ $Zn^{2}$   4. $Ag^{+}$ සහ $Mg^{2+}$   5. $Pb^{2+}$ සහ $Zn^{2+}$

07. $Ag(NH_3)_2Cl$ ද්‍රාවණයකට තනුක $HNO_3$ එකතු කල විට,

1. ඇමෝනියා වායුව මෝචනය වේ.
2. පෙනෙන වෙනසක් ඇති නොවේ.
3. දුඹුරු දුමාරයක් මෝචනය වේ.
4. සුදු අවක්ෂේපයක් සෑදේ
5. නිල් ලිට්මස් රතු පැහැයට හරවන වායුවක් මෝචනය වේ.

08. ආම්ලික මාධ්‍යයේදී $H_2S$ මගින් පහත කුමන කැටායන යුගලය වෙන්කර ගත හැකිද?

1. $Cu^{2+}$ සහ $Hg^{2+}$   2. $Cd^{2+}$ සහ $As^{3+}$   3. $Bi^{3+}$ සහ $Pb^{2+}$   4. $Sb^{3+}$ සහ $Pb^{2+}$   5. ඉහත කිසිවක් නොවේ

09. $BaCl_2$ ද්‍රාවණය අවක්ෂේපයක් නොදෙන්නේ පහත දැක්වෙන කුමක් සමඟද?

1. ජලීය $K_2SO_4$   2. ජලීය $AgNO_3$   3. ජලීය $K_2CO_3$   4. ජලීය NaOH   5. ජලීය $CsNO_3$

10. $SO_2$ මගින් මින් කුමක් ඔක්සිකරණය කළ හැකිද?

1. $KMnO_4$   2. $Cl_2$   3. $FeSO_4$   4. $H_2S$   5. $FeCl_3$

11. $AgNO_3$ සමඟ අවක්ෂේපයක් නොදෙන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

1. $BaCl_2$   2. $K_2SO_4$   3. NaOH   4. KBr   5. වැඩිපුර $NH_3$

12. ඇමෝනියම් ක්ලෝරයිඩ් හමුවේ දී මින් කුමන කැටායනය ජලීය ඇමෝනියා මගින් අවක්ෂේප වේ ද?

1. $Ni^{2+}$   2. $Zn^{2+}$   3. $Mg^{2+}$   4. $Cr^{3+}$   5. ඉහත කිසිවක් නොවේ.

13. ආම්ලික මාධ්‍යයේ දී $H_2S$ මගින් අවක්ෂේප නොවෙන්නේ මින් කුමන කැටායනය ද?

1. $Pb^{2+}$ 2. $Sn^{2+}$ 3. $Sn^{4+}$ 4. $Bi^{3+}$ 5. $Zn^{2+}$

14. සල්ෆයිඩ් අවක්ෂේප කිරීමේදී පහත දැක්වෙන කරුණු වලින් කුමක් සත්‍ය වේද?

1. ආම්ලික මාධ්‍යයේ දී $H_2S$ යැවීමෙන් PbS අවක්ෂේප කළ නොහැකි ය.
2. ආම්ලික මාධ්‍යයේ දී $H_2S$ යැවීමෙන් CoS අවක්ෂේප කළ නොහැකි ය.
3. ආම්ලික මාධ්‍යයේ දී $H_2S$ යැවීමෙන් $As_2S_3$ අවක්ෂේප කළ නොහැකි ය.
4. ඉහත සඳහන් එකක්වත් සත්‍ය නොවේ.
5. ඉහත සඳහන් සියල්ල සත්‍ය වේ

15. a. $CdSO_4$ b. $AgNO_3$ c. $FeSO_4$ d. $NiSO_4$ එක් එක් සංයෝගයේ ජලීය ද්‍රාවණය තුලින් $H_2S$ යැවූ විට අවක්ෂේප ලබා දෙන්නේ කවර ඒවා ද?

1. c,d පමණකි. 2. a,b,c,d සියල්ලම. 3. a,b,c පමණකි. 4. b,c,d පමණකි 5. a,c,d පමණකි.

16. $CuSO_4$ වල ජලීය ද්‍රාවණයකට වැඩිපුර $NH_4OH$ එකත කලවිට ලැබෙන වර්ණයට වඩාත්ම සමීප වර්ණයක් ඇති ද්‍රාවණයක් ලැබෙනුයේ පහත සඳහන් කුමන ක්‍රියාව මගින් ද?

1. $NiCl_2$ වල ද්‍රාවණයකට, වැඩිපුර තනුක HCl එකතු කිරීම.
2. $FeCl_3$ ද්‍රාවණයකට $NH_4CNS$ එකතු කිරීම.
3. සාන්ද්‍ර $CuSO_4$ ද්‍රාවණයකට සාන්ද්‍ර HCl එකතු කිරීම.
4. $K_2Cr_2O_7$ ද්‍රාවණයකට වැඩිපුර NaOH එකතු කිරීම.
5. සාන්ද්‍ර $CoCl_2$ ද්‍රාවණයකට වැඩිපුර සාන්ද්‍ර HCl එකතු කිරීම.

17. X නමැති සංයෝගය තනුක HCl සමඟ Y නමැති දුඹුරු වායුවක් සහ Z නමැති ද්‍රාවණයක් දුනි. Y ආම්ලික $KMnO_4$ අවර්ණ කලේ ය. Z බන්සන් දැල්ලේ වර්ණයක් ඇතිකල නමුත් එය රන්වන් පැහැයද තැඹිලි පැහැය ද යන්න නිගමනය කල නොහැකි විය. Z ද්‍රාවණයට වැඩිපුර $K_2CO_3$ ද්‍රාවණයක් එකතුකල විට සුදු අවක්ෂේපයක් ලැබුනි. X මින් කුමක් විය හැකි ද?

1. NaBr 2. $NaNO_3$ 3. $CaBr_2$ 4. $Ca(NO_2)_2$ 5. $Sr(NO_2)_2$

18. X නැමති අකාබනික සංයෝගයක් සුදු පැහැති වන අතර ජලයේ අද්‍රාව්‍ය වේ. සාන්ද්‍ර $HNO_3$ හි X ද්‍රාවණ වෙමින් නිල් පැහැති ද්‍රාවණයක් සහ දුඹුරු පැහැති වායුවක් දෙයි. මේ තුළට යැවූ විට දුඹුරු පැහැති ද්‍රාවණයක් සෑදේ. X මින් කුමක් විය හැකි ද?

1. $CuBr_2$ 2. $Cu(NO_2)_2$ 3. $Ni(NO_2)_2$ 4. CuBr 5. $NiBr_2$

19. P නැමති අකාබනික සංයෝගය සාන්ද්‍ර HCl සමඟ රත් කල විට Q නම් වායුවක් සහ R නම් ද්‍රාවණයක් ලබා දෙයි. ආම්ලික $KMnO_4$ වලින් තෙත් කරන ලද පරහන් කඩදාසියක් Q මගින් විවර්ණ කෙරේ. R වලට ජලීය ඇමෝනියා එකතුකල විට කොල පැහැයට හුරු අවක්ෂේපයක් ලැබේ. මේ අවක්ෂේපය වාතය සමඟ ප්‍රතික්‍රියා කර දුඹුරු පැහැයට හැරේ. P මින් කුමක් විය හැකිද?

1. Hg $SO_3$ 2. $Bi_2S_3$ 3. $CoSO_3$ 4. FeS 5. NiS

20. A නැමති අකාබනික සංයෝගය තනුක HCl හි ද්‍රාවණය වෙමින් B නැමති වායුවක් ලබා දෙයි. A තනුක $H_2SO_4$ සමඟ B වායුවම ලබාදෙන නමුත් පැහැදිලි ද්‍රාවණයක් ලබා නොදෙයි. B ආම්ලික $K_2Cr_2O_7$ ද්‍රාවණයක වර්ණය වෙනස් කරයි. B ජලීය $AgNO_3$ ද්‍රාවණයක් සමඟ කලු අවක්ෂේපයක් දෙයි. A දැල්ලේ පරීක්ෂාව කොළ වර්ණය දෙයි. A මින් කුමක් විය හැකි ද?

1. BaS 2. $CuSO_3$ 3. $CuS_2O_3$ 4. SrS 5. $SrSO_3$

21. A නැමති අකාබනික සංයෝගය ජලයෙහිද, තනුක සල්පියුරික් අම්ලයෙහිද කිසිම රසායනික ප්‍රතික්‍රියාවක් ඇති නොකරමින් පහසුවෙන් ද්‍රාවණය විය. A බන්සන් දැල්ලට කොල පැහැයක් ලබා දුනි. සා. $HNO_3$ අම්ලය සමඟ රත්කල විට A තද පැහැති වායුවක් දුනි. A මින් කුමක් විය හැකි ද?

1. $BaBr_2$ 2. $Ba(NO_2)_2$ 3. $CrI_3$ 4. $Cu(NO_2)_2$ 5. $CuBr_2$

22. X නැමති අකාබනික සංයෝගය ජලයේ අද්‍රාව්‍යය. X තනුක $HNO_3$ හි ද්‍රාවණය වී තැඹිලි පාට ද්‍රාවණයක් ලබා දෙයි. මේ ද්‍රාවණය පහන්සිලු පරීක්ෂාවේදී කොල පැහැයක් දෙයි. මේ ද්‍රාවණය තුලින් $H_2S$ වායුව යැවූ විට එය කොල පාටට හැරේ. X මින් කුමක් විය හැකි ද?

1. $CuCrO_4$ 2. $PbCrO_4$ 3. $Ba(MnO_4)_2$ 4. $BaCrO_4$ 5. $BaCl_2$

23. P නම් අකාබනික සංයෝගය තනුක HCl සමග අවර්ණ වායුවක් සහ අවර්ණ ද්‍රාවණයක් දුනි. වායුව ආම්ලික $K_2CrO_4$ කොල පැහැයට හැරවිය. ද්‍රාවණය තනුක $H_2SO_4$ සමග අවක්ෂේපයක් දුනි. P මින් කුමක් විය හැකි ද?

1. $Sr(NO_2)_2$ 2. $MgS_2O_3$ 3. SrS 4. $Ba(NO_2)_2$ 5. $NH_4HS$

24. Y නමැති අකාබනික සංයෝගය සා. $HNO_3$ සමග නැටවූ විට තද පැහැති වායුවක් දුනි. මෙයින් ලැබුනු ද්‍රාවණය $BaCl_2$ ද්‍රාවණයක් සමග සුදු පැහැති අවක්ෂේපයක් දුනි. Y හඳුනා ගන්න.

1. CuBr 2. CuI 3. AgI 4. $PbCO_3$ 5. $Ag_2CO_3$

25. D නැමති අකාබනික සංයෝගය ත. $H_2SO_4$ සමග ප්‍රතික්‍රියා කරවූ විට, දුඹුරු වායුවක් සහ වර්ණවත් ද්‍රාවණයක් ලැබුණි. මෙම ද්‍රාවණයෙන් කොටසකට ජලීය ඇමෝනියා අධික ප්‍රමාණයක් එකතු කල විට නිල් පැහැති ද්‍රාවණයක් ලැබුණි. ආරම්භයේදී ලැබුණ වර්ණවත් ද්‍රාවණයෙන් තවත් කොටසකට $H_2S$ වායුව යැවූ විට , කලු අවක්ෂේපයක් නොලැබුනි. D වීමට වඩාත්ම ඉඩ ඇත්තේ මින් කුමන එකට ද?

1. $Cu(NO_3)_2$ 2. $Cu(NO_2)_2$ 3. $Cd(NO_2)_2$ 4. $Ni(NO_3)_2$ 5. $Ni(NO_2)_2$

26. R නම් සංයෝගය ජලයේ අද්‍රාව්‍ය වන අතර එය සුදු පැහැති වේ. සා. $H_2SO_4$ සමග R ප්‍රතික්‍රියා කරවූ විට වර්ණවත් වායුවක් මුක්ත වේ. මෙයින් ලැබෙන ද්‍රාවණය බන්සන් දැල්ලට වර්ණයක් ගෙන දෙයි. R හඳුනා ගන්න.

1. $BaBr_2$ 2. $BaI_2$ 3. CuBr 4. $Cu(NO_2)_2$ 5. CuCl

27. X නමැති අකාබනික සංයෝගය තනුක HCl සමග ප්‍රතික්‍රියා කරවූ විට අවර්ණ ද්‍රාවණයක් හා දුර්වර්ණයක් ඇති වායුවක් දුනි. මේ ද්‍රාවණය බන්සන් දැල්ලට කොල පැහැයක් ලබා දුන් අතර වායුව කොබෝල්ට් නයිට්රේට් ද්‍රාවණයක් සමග කලු අවක්ෂේපයක් දුනි. X හඳුනා ගන්න.

1. Cu $SO_3$ 2. CuS 3. $BaSO_3$ 4. BaS 5. $BaS_2O_3$

28. එක්තරා මූලද්‍රව්‍යයක කැටායන තිබෙන ජලීය ද්‍රාවණයකින් KCNS ඝනය එකතු කල විට රතු වර්නයක් නොලැබුනි. මුල් ද්‍රාවණයෙන් තවත් කොටසකට ජලීය ඇමෝනියා එකතු කර, මද වේලාවක් පෙසෙක තබන ලදි. මෙයින් ලැබෙන ඵලය තනුක HCl එකතු කිරීමෙන් ආම්ලික කරන ලදී. මෙම ආම්ලික ද්‍රාවණයට KCNS ඝනය එකතු කල විට රතු වර්ණයක් ලැබුනි. සලකා බලන කැටායනය,

1. $Cr^{3+}$ විය හැකිය. 2. $Mn^{2+}$ විය හැකිය. 3. $Cu^{2+}$ විය හැකිය. 4. $Fe^{2+}$ විය හැකිය 5. $Fe^{3+}$ විය හැකිය.

29. X නැමති අකාබනික සංයෝගය තනුක හයිඩ්‍රොක්ලෝරික් අම්ලය සමග ප්‍රතික්‍රියා කරවූ විට, අවර්ණ වායුවක් සහ වර්ණවත් ද්‍රාවණයක් ලැබුනි. මෙම වායුව ජලීය හයිඩ්‍රජන් සල්ෆයිඩ් ද්‍රාවණයක් තුලට යැවූ විට, අවක්ෂේපයක් ලැබුණි. ඉහත සඳහන් වර්ණවත් ද්‍රාවණයට ජලීය ඇමෝනියා වැඩිපුර එකතු කළ විට වර්ණවත් අවක්ෂේපයක් ලැබුනි. මින් කුමක් X විය හැකිද?

1. $Fe(NO_2)_3$ 2. $Cr_2(SO_3)_3$ 3. $Cr_2(CO_3)_3$ 4. $CuSO_3$ 5. $Cu(NO_2)_2$

- පහත ප්‍රශ්න (3) සඳහා දැක්වෙන සංයෝග සලකන්න.

(A) $K_2CrO_4$ (B) $ZnSO_4$ (C) $CuCl_2$ (D) $FeCl_3$ (E) $NiSO_4$

30. ඉහත සඳහන් කුමක් / කුමන ඒවා $H_2S$ වලින් සංතෘප්ත කරන ලද තනුක HCl සමග අවක්ෂේපයක් දීමට ඉඩ ඇති ද?

1. A පමණකි. 2. A , B පමණකි. 3. C පමණකි. 4. A, C, D පමණකි. 5. B, E පමණකි.

31. ඉහත සඳහන් කුමක් / කුමන ඒවා KI සමග ඇතැම් විශේෂිත තත්ව යටතේදී $I_2$ මුක්ත කිරීමට ඉඩ ඇති ද?

1. A, B පමණකි. 2. A, C, D පමණකි. 3. A , D පමණකි. 4. A, C පමණකි. 5. C , D, E පමණකි.

32. ඉහත සඳහන් කුමක් / කුමන ඒවා ඇතැම් විශේෂිත තත්ව යටතේදී $CH_3CHO$ ඔක්සිකරණය කරයි ද?

1. A පමණකි. 2. B, D පමණකි. 3. A, C පමණකි. 4. C පමණකි. 5. A , B, E පමණකි.

33. මේවායින් ආන්තරික ලක්ෂණ පවතින්නේ,

1. $Sc^{3+}$ 2. Zn 3. $Cu^{+}$ 4. $Cu^{3+}$ 5. $Zn^{2+}$

34. Zn වලට වඩාත් ම සමාන රසායනික ගුණ ඇති මූලද්‍රව්‍ය වනනේ,

1. Ca 2. Sr 3. Pb 4. Mg 5. Cd **(2000)**

35. නයිට්‍රජන්වලට ඔක්සිකාරකයක් වශයෙන් ක්‍රියා කළ හැකිය. ඉහත දැක්වෙන ප්‍රකාශයට අදාළව පහත සඳහන් අදහස් අතුරින් කුමක් නිවැරදි වේ ද?

1. නයිට්‍රජන් ද්වි පරමාණුක වායුවක් නිසාය. 2. නයිට්‍රජන් ආවර්තිතා වගුවේ 5 වන කාණ්ඩයට අයත් වන නිසා ය.
3. නයිට්‍රජන් හි ඇති බහු බන්ධනය දුර්වල නිසා ය. 4. දී ඇති ප්‍රකාශය වැරදි ය.
5. නිවැරදි පිළිතුර ඉහත දී නැත.

36. උණුසුම් $NaNO_2$ ද්‍රාවණයකට $NH_4Cl$ ද්‍රාවණයක් එකතු කළ විට,

1. NO සෑදේ 2. NO සහ $NO_2$ සෑදේ. 3. NO සෑදේ.
4. $N_2$ සෑදේ. 5. $HNO_3$ සහ $HNO_2$ සෑදේ.

37. රත්කළ විට මින් කුමන සංයෝගය $N_2O_4$ ලබා දෙයි ද?

1. $N_2O$ 2. $HNO_3$ 3. $NaNO_3$ 4. $NH_4NO_3$ 5. $(NH_4)_2Cr_2O_7$

38. නයිට්‍රජන් සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය අසත්‍ය වීමට වඩාත් ම ඉඩ තිබේ ද?

1. $NCl_3$ පවතී. 2. $NF_3$ පවතී. 3. $NO_2^+$ පවතී. 4. $NF_5$ පවතී. 5. $N_2H_4$ පවතී.

39. මින් කුමක් රත් කිරීමෙන් $NO_2$ නොලැබේ ද?

1. $Ca(NO_3)_2$ 2. $CsNO_3$ 3. $Cd(NO_3)_2$ 4. $Al(NO_3)_3$ 5. $Pb(NO_3)_2$

40. $2NO_2(g) + H_2O(l) \rightarrow HNO_3(aq) + HNO_2(aq)$ යන ප්‍රතික්‍රියාවේ දී,

1. නයිට්‍රජන් ඔක්සිකරණයට පමණක් භාජනය වේ.
2. නයිට්‍රජන් ඔක්සිහරණයට පමණක් භාජනය වේ.
3. නයිට්‍රජන් ඔක්සිකරණයට මෙන්ම ඔක්සිහරණයට ද භාජනය වේ.
4. නයිට්‍රජන් ඔක්සිකරණ අවස්ථාවේ වෙනසක් සිදු නොවේ.
5. ජලය, ඔක්සිකාරකයක් වශයෙන් ද ඔක්සිහාරකයක් වශයෙන් ද ක්‍රියා කරයි. **(2000)**

41. පොස්පරස්හි ඔක්සි අම්ල තුනක් සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය සත්‍ය වේ ද?

1. $H_3PO_2$ අණුවේ P - H බන්ධන එකක් තිබේ. 2. $H_3PO_2$ අණුවේ P - H බන්ධන තුනක් තිබේ.
3. $H_3PO_4$ අණුවේ P - H බන්ධන එකක් තිබේ. 4. $H_3PO_4$ අණුවේ O - H බන්ධන තුනක් තිබේ.
5. $H_3PO_3$ අණුවේ O - H බන්ධන තුනක් තිබේ.

42. පොස්පරස් හි රසායනය සම්බන්ධයෙන් වන මින් කුමන ප්‍රකාශය සත්‍ය වේද?

1. $H_3PO_4$ අණුවෙහි O - H බන්ධන තුනක් තිබේ. 2. $H_3PO_3$ අණුවෙහි O - H බන්ධන දෙකක් තිබේ.
3. $H_3PO_2$ අණුවෙහි O - H බන්ධන දෙකක් තිබේ. 4. පොස්පරස් ක්ලෝරීන් සමඟ ප්‍රතික්‍රියා නොකරයි.
5. පොස්පරස් ජලය සමඟ ප්‍රතික්‍රියා කරයි.

43. ජලයෙහි අඩංගු ක්ලෝරයිඩ අයන අනාවරණය කිරීමට හොඳම ක්‍රමය වනුයේ,

1. $AgNO_3$ ද්‍රාවණය එකතු කිරීමයි. 2. තනුක $HNO_3$ සහ $AgNO_3$ ද්‍රාවණ එකතු කිරීම යි.
3. $NH_4OH$ සහ $AgNO_3$ ද්‍රාවණ එකතු කිරීම යි. 4. තනුක HCl හා $AgNO_3$ ද්‍රාවණ එකතු කිරීම යි.
5. තනුක $H_2SO_4$ හා $AgNO_3$ ද්‍රාවණ එකතු කිරීම යි. **(2000)**

44. (i) වැඩිපුර $NH_4OH$ සමඟ නිල් පැහැති ද්‍රාවණයක් දෙන,
(ii) තනුක HCl හි $H_2S$ සමඟ අවක්ෂේපයක් නොදෙන සහ,
(iii) සාන්ද්‍ර HCl සමඟ කහ-දුඹුරු පැහැති ද්‍රාවණයක් දෙන කැටායනය වනුයේ,
1. $Cr^{3+}$ 2. $Ni^{2+}$ 3. $Co^{2+}$ 4. $Cu^{2+}$ 5. $Mn^{2+}$ **(2001)**

45. සුදු පැහැති අකාබනික ලවණයක් තනුක HCl වල ද්‍රාවණය කරන ලදී. මෙම ද්‍රාවණය වැඩිපුර $NH_4OH$ මගින් භාෂ්මික කළ විට, අවර්ණ පැහැදිලි ද්‍රාවණයක් ලැබිණ. මෙම ද්‍රාවණයෙන් එක් කොටසක් $H_2S$ සමඟ පිරියම් කළ විට සුදු පැහැති අවක්ෂේපයක් ලැබිණ. ද්‍රාවණයේ ඉතිරි කොටස, ජලීය $Ba(OH)_2$ සමඟ පිරියම් කළ විට ද සුදු පැහැති අවක්ෂේපයක් ලැබිණ. මෙම ලවණය වන්නේ,
1. $ZnCl_2$ 2. $AlCl_3$ 3. $MgSO_4$ 4. $ZnSO_4$ 5. $NaAlO_2$ **(2002)**

46. A නම් ලවණයක තනුක HCl ද්‍රාවණයක්,
(i) අවර්ණ ය.
(ii) $H_2S$ සමඟ තැඹිලි පැහැති අවක්ෂේපයක් දෙයි.
(iii) ජලයට එකතු කළ විට සුදු පැහැති අවක්ෂේපයක් දෙයි.
A ලවණයෙහි අඩංගු කැටායනය වනුයේ,
1. $Cd^{2+}$ 2. $Sb^{3+}$ 3. $Pb^{2+}$ 4. $Bi^{3+}$ 5. $Sn^{2+}$ **(2002)**

47. සාන්ද්‍ර $H_2SO_4$ මෙන් ම නිර්ජලීය $CaCl_2$ භාවිත කරමින් වියළිය හැක්කේ පහත සඳහන් කුමන වායු යුගලය ද?
1. $NH_3$ සහ $SO_2$ 2. $SO_2$ සහ $F_2$ 3. $Cl_2$ සහ HCl 4. $Cl_2$ සහ $F_2$ 5. HCl සහ $SO_2$ **(2003)**

48. $H_2S$ සමඟ ප්‍රතික්‍රියා කළ විට එක් ඵලයක් ලෙස සල්ෆර් ලබා නොදෙන්නේ පහත සඳහන් ජලීය ද්‍රාවණ අතරෙන් කවරක් ද?
1. FeCl 2. $Br_2$ ජලය 3. $Pb(CH_3COO)_2$ 4. $HNO_3$ 5. $H_2SO_3$ **(2004)**

49. $H_2O_2$ ඔක්සිහාරකයක් ලෙස ක්‍රියා කරන්නේ පහත සඳහන් කුමන සංයෝගය සමඟ ද?
1. $H_2S$ 2. KI 3. $FeSO_4$ 4. $SO_2$ 5. $Ag_2O$ **(2005)**

50. ගුණාත්මක විශ්ලේෂණයේ III වැනි කාණ්ඩයේ දී, II වැනි කාණ්ඩයේ පෙරනය,
1. $NH_4Cl$ සහ $NH_4OH$ සමඟ පිරියම් කරනු ලැබේ.
2. $HNO_3$ සමඟ නටවා, ඊළඟට $NH_4Cl$ සහ $NH_4OH$ සමඟ පිරියම් කරනු ලැබේ.
3. නටවා, ඊළඟට $NH_4Cl$ සහ $NH_4OH$ සමඟ පිරියම් කරනු ලැබේ.
4. නටවා, ඊළඟට $HNO_3$ සමඟ රත්කර, $NH_4Cl$ සහ $NH_4OH$ සමඟ පිරියම් කරනු ලැබේ.
5. $HNO_3$ , $NH_4Cl$ සහ $NH_4OH$ සමඟ නටවනු ලැබේ. **(2005)**

51. රත්කිරීමේ දී, එක් ඵලයක් ලෙස නයිට්‍රජන්හි ඔක්සයිඩයක් ලබා දෙන්නේ පහත සංයෝග වලින් කුමන එකද?
1. $(NH_4)_2CO_3$ 2. $NH_4NO_2$ 3. $NH_4NO_3$ 4. $(NH_4)_2Cr_2O_7$ 5. $(NH_4)_2SO_4$ **(2007)**

52. පහත දී ඇති **A**, **B**, **C** සහ **D** සංයෝගවලින් කුමන ඒවා රත් කිරීමේ දී $NH_{3\,(g)}$ පිට කරයි ද? **(2007)**
**A**. $(NH_4)_2Cr_2O_7$ **B**. $NH_4Cl$ **C**. $(NH_4)_2CO_3$ **D**. $NH_4NO_3$
1. **A** සහ **B** 2. **B** සහ **C** 3. **C** සහ **D** 4. **A** සහ **D** 5. **B** සහ **D**

53. X ලවණයේ ජලීය ද්‍රාවණයකට $H_2S$ යැවූ විට කහ අවක්ෂේපයක් සෑදේ. X හි ජලීය ද්‍රාවණයක් වැඩිපුර $Na_2CO_3$ සමඟ පිරියම් කර , පෙරා, ලැබෙන පෙරනයට $H_2S$ යැවූ විට කහ අවක්ෂේපයක් නැවත සෑදේ. X ලවණයෙහි නියත වශයෙන්ම තිබෙන කැටායනය / ඇනායනය වනුයේ,
1. $Sn^{2+}$ 2. $Sb^{3+}$ 3. $Cd^{2+}$ 4. $CrO_4^{2-}$ 5. $AsO_3^{3-}$ **(2007)**

54. X ලවණය, අවර්ණ ද්‍රාවණයක් සාදමින් තනුක HCl හි ද්‍රාවණය වේ. මෙම ද්‍රාවණය

(i) ජලයෙන් තනුක කළ විට සුදු අවක්ෂේපයක් ලබා දෙයි.

(ii) $H_2S$ යැවූ විට කළු අවක්ෂේපයක් ලබා දෙයි.

**X** හි ඇති කැටායනය වනුයේ,

1. $Cu^{2+}$ 2. $Bi^{3+}$ 3. $Hg^{2+}$ 4. $Sb^{3+}$ 5. $As^{3+}$ **(2008)**

55. X ලවණයක් තනුක $H_2SO_4$ සමග රත් කළ විට, එය ලෙඩ් ඇසිටේට් ද්‍රාවණයක් සමඟ සුදු අවක්ෂේපයක් දෙන වායුවක් පිට කළේය. X; තනුක $H_2SO_4$ සහ Zn සමග රත් කළ විට, එය ලෙඩ් ඇසිටේට ද්‍රාවණයක් සමඟ කළු අවක්ෂේපයක් දෙන වායුවක් පිට කළේය. X හි ඇති ඇනායනය වනුයේ,

1. $S^{2-}$ 2. $Cl^-$ 3. $NO_3^-$ 4. $CO_3^{2-}$ 5. $SO_3^{2-}$ **(2009)**

56. ජලීය $FeBr_3$ ද්‍රාවණයක් සමඟ ප්‍රතික්‍රියා කරන්නේ පහත සඳහන් කුමන වායු ද?

(A) $SO_2$ (B) $CO_2$ (C) $H_2S$ (D) $Cl_2$

1. A සහ B 2. A,B සහ C 3. A,C සහ D 4. C සහ D 5. A,B සහ D **(2009)**

57. I සහ II කාණ්ඩවල මූලද්‍රව්‍ය (*s*-ගොනුවේ මූලද්‍රව්‍ය) සහ ඒවායේ සංයෝග සම්බන්ධයෙන්, පහත සඳහන් කුමන ප්‍රකාශය නිවැරදි වේ ද?

1. I සහ II කාණ්ඩයේ සියලුම මූලද්‍රව්‍ය සිසිල් ජලය සමග ප්‍රතික්‍රියාකර $H_2$ සහ ඒවායේ ලෝහ හයිඩ්‍රොක්සයිඩ ලබාදෙයි.
2. රත් කිරීමේදී $LiNO_3$ වියෝජනය වී වායු වශයෙන් $NO_2$ සහ $O_2$ ලබා දෙයි.
3. කාණ්ඩයේ පහළට යෑමේදී II කාණ්ඩයේ සල්ෆේටවල ද්‍රාව්‍යතාව අඩු වේ.
4. කාණ්ඩයේ පහළට යෑමේදී II කාණ්ඩයේ හයිඩ්‍රොක්සයිඩවල භාස්මික ප්‍රබලතාව අඩු වේ.
5. II කාන්ඩයේ මූලද්‍රව්‍යවල කාබනේට රත්කිරීමෙන් ඒවායේ ඔක්සයිඩ ලබා ගත හැකිය. **(2012)**

58. රත් කිරීමේදී භාස්මික වායුවක් ලබා දෙන්නේ පහත සංයෝග අතුරෙන් කුමන සංයෝගය/සංයෝග ද?

(A) $(NH_4)_2CO_3$ (B) $NH_4Cl$ (C) $NH_4NO_2$ (D) $NH_4NO_3$ (E) $(NH_4)_2Cr_2O_7$

1. A පමණි. 2. B පමණි. 3. E පමණි. 4. A සහ B පමණි. 5. C සහ D පමණි. **(2012)**

59. X නම් අකාබනික ඝනයක් තනුක HCl සමඟ පිරියම් කළ විට, අවර්ණ ද්‍රාවණයක් හා ලෙඩ් ඇසිටේට් ද්‍රාවණයකින් තෙත් කරන ලද පෙරහන් කඩදාසියක් කළු පැහැ ගන්වන වායුවක් ලැබුණි. අවර්ණ ද්‍රාවණය පහන් සිළු පරීක්ෂාවට භාජනය කළ විට ඇපල් කොළ පැහැති දැල්ලක් දක්නට ලැබුණි.

X ඝනය වනුයේ,

1. BaS 2. $CuSO_3$ 3. $BaSO_3$ 4. NiS 5. $CuCO_3$ **(2013)**

60. හයිපොක්ලෝරස් අම්ලය (HOCl) සම්බන්ධයෙන් පහත සඳහන් කුමන වගන්තිය **අසත්‍ය** වේ ද?

1. HOCl දුර්වල අම්ලයකි.
2. HOCl හි ක්ලෝරීන්හි ඔක්සිකරණ අවස්ථාව -1 වේ.
3. ජලීය HOCl ද්‍රාවණයකට KI එක් කිරීමේ දී $I_2$ නිපදවේ.
4. භාෂ්මික ද්‍රාවණයේ දී, රත් කළ විට HOCl ද්විධාකරණය වේ.
5. HOCl ක්ෂාර සමඟ ප්‍රතික්‍රියා කර හයිපොක්ලෝරයිට් නම් ලවණ සාදයි. **(2013)**

61. ඇමෝනියා ($NH_3$) පිළිබඳව මින් කුමන වගන්තිය **අසත්‍ය** වේ ද?

1. $NH_3$ හි N වල ඔක්සිකරණ අවස්ථාව -3 වේ.
2. නෙස්ලර් ප්‍රතිකාරකය සමඟ $NH_3$ රෝස පැහැයක් දෙයි.
3. නයිට්‍රික් අම්ලය නිපදවීමේ දී එක් අමුද්‍රව්‍යයක් ලෙස $NH_3$ භාවිත කරයි.
4. බොර තෙල්වල ඇති ආම්ලික සංඝටක ඉවත් කිරීම සඳහා $NH_3$ භාවිත කරයි.
5. $NaNO_3$ , Al කුඩු සහ ජලය NaOH සමග රත් කිරීමේ දී $NH_3$ නිපදවේ. **(2013)**

62. ජලය සමමවුල ප්‍රමාණයක් සමඟ $PCl_5$ ප්‍රතික්‍රියා කළ විට ඵල වනුයේ,

(1) $POCl_3$ සහ HCl (2) $H_3PO_4$ සහ HCl (3) $H_3PO_3$ සහ HCl
(4) $H_3PO_4$ සහ $POCl_3$ (5) $POCl_3$ සහ $H_2$ **(2014)**

63. (i) $OH^-$ ඇතිවිට $H_2S$ සමඟ කළු පැහැති අවක්ෂේපයක් ලබා දෙන
(ii) තනුක HCl ඇති විට $H_2S$ සමඟ අවක්ෂේපයක් නොදෙන හා
(iii) සාන්ද්‍ර HCl සමග නිල් පැහැති ද්‍රාවණයක් ලබා දෙන
කැටායනය හඳුනා ගන්න.

(1) $Cu^{2+}$ (2) $Mn^{2+}$ (3) $Ni^{2+}$ (4) $Fe^{3+}$ (5) $Co^{2+}$ **(2014)**

64. Li , Na , K සහ Mg වායුගෝලීය පීඩනයේ දී වැඩිපුර ඔක්සිජන් සමඟ ප්‍රතික්‍රියා කළ විට ලැබෙන ප්‍රධාන ඵල පිළිවෙළින් වනුයේ,

(1) $Li_2O$ , $Na_2O$ , $K_2O_2$ සහ MgO (2) $Li_2O$ , $Na_2O_2$, $KO_2$ සහ MgO
(3) $Li_2O$ , $Na_2O_2$ , $KO_2$ සහ $Mg(O_2)_2$ (4) $LiO_2$ , $Na_2O$ , $KO_2$ සහ $MgO_2$
(4) $Li_2O$ , $Na_2O_2$ , $KO_2$ සහ $MgO_2$ **(2014)**

65. ඇලුමිනියම්හි රසායනය පිළිබඳ ව පහත සඳහන් කුමන වගන්තිය **අසත්‍ය** වේ ද?

(1) ඇලුමිනියම් සංයෝග උත්ප්‍රේරක වශයෙන් භාවිත වේ.
(2) ඇලුමිනියම් ලෝහය තනුක HCl සමග ප්‍රතික්‍රියා කර $H_2$ වායුව සාදයි.
(3) ඝන ඇලුමිනියම් ක්ලෝරයිඩ් ජලයේ දිය කළ විට සෑදෙන ද්‍රාවණය භාෂ්මික වේ.
(4) ඝන ඇලුමිනියම් ක්ලෝරයිඩ් හි ඇලුමිනියම් පරමාණු වටා හැඩය චතුස්තලීය වේ.
(5) ඝන අවස්ථාවේ ඇලුමිනියම් ක්ලෝරයිඩ් ද්වි-අවයවයක් වශයෙන් පවතී. **(2015)**

66. ආවර්තිතා වගුවේ *s*-ගොනුවේ මූලද්‍රව්‍ය (I වන කාණ්ඩය, Li සිට Cs සහ II වන කාණ්ඩය, Be සිට Ba) සම්බන්ධයෙන් පහත සඳහන් කුමන වගන්තිය **සත්‍ය** වේද?

(1) I සහ II කාණ්ඩවල සියලු ම මූලද්‍රව්‍ය ජලය සමග ප්‍රතික්‍රියා කර $H_2$ වායුව ලබා දෙයි.
(2) I කාණ්ඩයේ සියලුම මූලද්‍රව්‍ය $N_2$ වායුව සමග ප්‍රතික්‍රියා කරයි.
(3) Mg තනුක සහ සාන්ද්‍ර $H_2SO_4$ යන දෙකම සමග ප්‍රතික්‍රියා කර පිළිවෙළින් $H_{2(g)}$ සහ $SO_{2(g)}$ ලබා දෙයි.
(4) Li වාතය සමග ප්‍රතික්‍රියා කර $Li_2O$ , $LiO_2$ සහ $Li_3N$ මිශ්‍රණයක් සාදයි.
(5) I කාණ්ඩයේ සියලු ම මූලද්‍රව්‍ය $H_2$ වායුව සමග ප්‍රතික්‍රියා කර සහසංයුජ හයිඩ්‍රයිඩ ලබා දෙයි. **(2015)**

67. s හා p ගොනුවේ මූලද්‍රව්‍ය සාදන අයනවල විශාලත්වය සම්බන්ධයෙන් පහත සඳහන් කුමන වගන්තිය අසත්‍ය වේ ද?

(1) කැටායන, ඒවායේ උදාසීන පරමාණුවලට වඩා සෑමවිටම කුඩා ය.
(2) ඇනායන, ඒවායේ උදාසීන පරමාණුවලට වඩා සෑමවිටම විශාල ය.
(3) ආවර්තයක් හරහා වමේ සිට දකුණට කැටායනවල විශාලත්වය අඩු වේ.
(4) ආවර්තයක් හරහා වමේ සිට දකුණට ඇනායනවල විශාලත්වය වැඩි වේ.
(5) දෙවැනි ආවර්තයේ මූලද්‍රව්‍ය සාදන ඇනායන, තුන්වැනි ආවර්තයේ මූලද්‍රව්‍ය සාදන කැටායනවලට වඩා විශාල වේ.

**(2016)**

68. ලිතියම් (Li) සහ එහි සංයෝගවල රසායනය සම්බන්ධයෙන් පහත සඳහන් කුමන වගන්තිය **අසත්‍ය** වේ ද?

(1) ලිතියම්, ඔක්සිජන් වායුව සමග ප්‍රතික්‍රියා කර $Li_2O$ ලබා දේ.

(2) I කාණ්ඩයේ ලෝහ අතුරෙන් ඉහළ ම ද්‍රවාංකය ඇත්තේ ලිතියම්වලට ය.

(3) LiOH හි භාස්මිකතාව NaOH හි භාස්මිකතාවට වඩා අඩු ය.

(4) I කාණ්ඩයේ කාබනේට අතුරෙන් අඩුම තාපස්ථායිතාවක් ඇත්තේ $Li_2CO_3$ වලට ය.

(5) LiCl පහන්සිළු පරීක්ෂාවට භාජනය කළ විට නිල් පැහැයක් ලබා දේ. **(2016)**

69. ආන්තරික ලෝහ හා ඒවායේ සංයෝග පිළිබඳ ව මින් කුමන වගන්තිය සත්‍ය වේ ද?

(1) කොපර් හි ඉලෙක්ට්‍රෝන වින්‍යාසය $1s^2\ 2s^2\ 2p^6\ 3s^2\ 3p^6\ 3d^{10}$ වේ.

(2) d- ඉලෙක්ට්‍රෝන ඇති සියලු ම මූලද්‍රව්‍ය, 'ආන්තරික මූලද්‍රව්‍ය' වේ.

(3) $TiO_2$ හි Ti වල ඉලෙක්ට්‍රෝන වින්‍යාසය හා $ScCl_3$ හි Sc වල ඉලෙක්ට්‍රෝන වින්‍යාසය එකම වේ.

(4) දෙන ලද ආන්තරික ලෝහයක ඔක්සයිඩවල ආම්ලිකතාව, ලෝහ අයනයෙහි ඔක්සිකරණ අවස්ථාව වැඩිවන විට අඩු වේ.

(5) 3d ශ්‍රේණියේ ආන්තරික ලෝහවලට ක්වොන්ටම් අංකය $m_l = \pm 3$ තිබිය හැක.

**(2016)**

70. 3d ආන්තරික ලෝහ සහ ඒවායේ සංයෝග පිළිබඳ ව පහත සඳහන් කුමන වගන්තිය අසත්‍ය වේ ද?

(1) සමහර ලෝහවල ඔක්සයිඩ උභයගුණී වේ.

(2) සමහර ලෝහ සහ ලෝහ ඔක්සයිඩ උත්ප්‍රේරක ලෙස කර්මාන්තවල යොදා ගනු ලැබේ.

(3) 3d ආන්තරික ලෝහවල විද්‍යුත් සෘණතාව 4s ලෝහවල විද්‍යුත් සෘණතාවට වඩා ඉහළ ය.

(4) +7 ඔක්සිකරණ අවස්ථාව පෙන්නුම් කරන්නේ එක මූලද්‍රව්‍යයක් පමණි.

(5) $MnO_4^-$ , $Cr_2O_7^{2-}$ වැනි ඔක්සොඅයන ඔක්සිහරණයට ප්‍රතිරෝධයක් දක්වයි.

**(2016)**

71. $NH_3$ සම්බන්ධව පහත සඳහන් කුමන වගන්තිය **අසත්‍ය** වේ ද?

(1) $NH_3$ වලට ක්‍රියා කළ හැක්කේ භස්මයක් ලෙස පමණි.

(2) $NH_3$ ඔක්සිජන් වල දහනය වී $N_2$ වායුව ලබා දේ.

(3) $NH_3$ නෙස්ලර් ප්‍රතිකාරකය සමග දුඹුරු වර්ණයක් ලබා දේ.

(4) $NH_3$ , Li සමග ප්‍රතික්‍රියා කර $Li_3N$ සහ $H_2$ වායුව ලබා දේ.

(5) $NH_3$ වල බන්ධන කෝණය $109^0\ 28^/$ ට වඩා අඩුවන නමුත්, $NF_3$ වල බන්ධන කෝණයට වඩා වැඩි වේ.

**(2016)**

72. ක්ෂාර හා ක්ෂාරීය පාංශු ලෝහ සම්බන්ධයෙන් මින් කුමන වගන්තිය **අසත්‍ය** වේ ද?

(1) සියලු ම ක්ෂාරීය පාංශු ලෝහ $N_2$ වායුව සමඟ ඉහළ උෂ්ණත්වයේ දී ප්‍රතික්‍රියා කරයි.

(2) ක්ෂාරීය පාංශු ලෝහවල ද්‍රවාංක එම ආවර්තයේම ඇති ක්ෂාර ලෝහවල ද්‍රවාංකවලට වඩා වැඩි ය.

(3) ක්ෂාර ලෝහවල දෙවන අයනීකරණ ශක්තීන් එම ආවර්තයේම ඇති ක්ෂාරීය පාංශු ලෝහවල එම අගයයන්ට වඩා බොහෝ වැඩි ය.

(4) ක්ෂාරීය පාංශු ලෝහ සාදන සියලු ම හයිඩ්‍රොක්සයිඩ ප්‍රබල භෂ්ම වේ.

(5) ක්ෂාර ලෝහ හයිඩ්‍රොක්සයිඩවල ද්‍රාව්‍යතාව කාණ්ඩයේ පහළට වැඩි වේ. **(2017)**

73. සල්ෆර් සහ එහි සංයෝග සම්බන්ධයෙන් පහත සඳහන් කුමන වගන්තිය **අසත්‍ය** වන්නේ ද?

(1) S යනු ඔක්සිකරණ අවස්ථා -2 සිට +6 පරාසයක් ඇති අලෝහයකි.

(2) එක් ඵලයක් ලෙස $SO_3$ ලබා දෙමින් සාන්ද්‍ර $H_2SO_4$ සමඟ S ප්‍රතික්‍රියා කරයි.

(3) ඔක්සිකාරකයක් සහ ඔක්සිහාරකයක් යන දෙආකාරයටම $SO_2$ ට ක්‍රියා කළ හැක.

(4) විශාල ප්‍රමාණයන්ගෙන් S දහනය කිරීම අම්ල වැසිවලට දායක වේ.

(5) සාන්ද්‍ර $H_2SO_4$ ට ප්‍රබල අම්ලයක්, ඔක්සිකාරකයක් සහ විජලකාරකයක් ලෙස ක්‍රියා කළ හැක. **(2017)**

74. පහත සඳහන් කුමන ප්‍රකාශය අසත්‍ය වේ ද?

(1) ආවර්තිතා වගුවේ දෙවන කාණ්ඩයේ සියලු ම ලෝහවල කාබනේට ජලයේ අද්‍රාව්‍ය වුව ද ඒවායේ බයිකාබනේට ද්‍රාව්‍ය වේ.

(2) ආවර්තිතා වගුවේ දෙවන කාණ්ඩයේ සියලු ම ලෝහවල හයිඩ්‍රොක්සයිඩ ජලයේ ද්‍රාව්‍ය වේ.

(3) ආවර්තිතා වගුවේ දෙවන කාණ්ඩයේ සියලු ම ලෝහවල නයිට්‍රේට ජලයේ ද්‍රාව්‍ය වේ.

(4) Na සහ Mg වල ඔක්සයිඩ සහ හයිඩ්‍රොක්සයිඩ භාස්මී ගුණ පෙන්වන අතර Al හි ඔක්සයිඩය සහ හයිඩ්‍රොක්සයිඩය උභයගුණී ලක්ෂණ පෙන්නුම් කරයි.

(5) Si සහ S වල හයිඩ්‍රයිඩ දුර්වල ආම්ලික ගුණ පෙන්නුම් කරයි. **(2018)**

75. ආවර්තිතා වගුවේ s-ගොනුවේ මූලද්‍රව්‍ය පිළිබඳ ව පහත කුමන වගන්තිය අසත්‍ය වන්නේද?

(1) I කාණ්ඩයේ සියලු ම මූලද්‍රව්‍ය ජලය සමග ප්‍රතික්‍රියා කර $H_2$ වායුව නිදහස් කරයි.

(2) Li හැර I කාණ්ඩයේ අනිකුත් සියලු ම මූලද්‍රව්‍ය $N_2$ වායුව සමඟ ප්‍රතික්‍රියා කරයි.

(3) II කාණ්ඩයේ සියලු ම මූලද්‍රව්‍ය $N_2$ වායුව සමග ප්‍රතික්‍රියා කරයි.

(4) වැඩිපුර $O_2$ සමග Na ප්‍රතික්‍රියා කර $Na_2O_2$ ලබා දෙන අතර K , $KO_2$ ලබා දෙයි.

(5) s-ගොනුවේ සියලු ම මූලද්‍රව්‍ය හොඳ ඔක්සිහාරක වේ. **(2018)**

76. පහත දක්වෙන ඒවායින් නිවැරදි ප්‍රකාශය හඳුනාගන්න.

(1) $NF_3$ වල බන්ධන කෝණය $NH_3$ වල බන්ධන කෝණයට වඩා විශාල වේ.

(2) 17 වන කාණ්ඩයේ (හෝ 7A) මූලද්‍රව්‍ය, ඔක්සිකරණ අවස්ථා -1 සිට +7 දක්වා පෙන්නුම් කරයි.

(3) කාමර උෂ්ණත්වයේ දී සල්ෆර්වල වඩාත් ම ස්ථායි බහුරූපී ආකාරය ඒකානති සල්ෆර් වේ.

(4) මිනිරන්වල ඝනත්වය දියමන්තිවල ඝනත්වයට වඩා වැඩි ය.

(5) වායුමය අවස්ථාවේ දී ඇලුමිනියම් ක්ලෝරයිඩ් අෂ්ටක නියමය තෘප්ත කරයි. **(2019)**

77. ක්ලෝරීන්හී ඔක්සෝඅම්ල වන HOCl , $HClO_2$ , $HClO_3$ හා $HClO_4$ පිළිබඳ වැරදි වගන්තිය වනුයේ,

(1) $HClO_2$ , $HClO_3$ හා $HClO_4$ හි ක්ලෝරීන් වටා හැඩයන් පිළිවෙළින් කෝණික, පිරමීඩීය හා චතුස්තලීය වේ.

(2) HOCl , $HClO_2$ , $HClO_3$ හා $HClO_4$ හි ක්ලෝරීන්වල ඔක්සිකරණ අවස්ථා පිළිවෙළින් +1 , +3 , +5 හා +7 වේ.

(3) ඔක්සෝඅම්ලවල අම්ල ප්‍රබලතාව $HOCl < HClO_2 < HClO_3 < HClO_4$ ලෙස වෙනස් වේ.

(4) මෙම ඔක්සොඅම්ල සියල්ලෙහි ම අඩු තරමින් එක් ද්විත්ව බන්ධනයක්වත් අඩංගු වේ.

(5) මෙම ඔක්සොඅම්ල සියල්ලෙහි ම අඩු තරමින් එක් OH කාණ්ඩයක්වත් අඩංගු වේ. **(2019)**

78. M යනු ආවර්තිතා වගුවේ දෙවන ආවර්තයට අයත් මූලද්‍රව්‍යයකි. එය ද්විධ්‍රැව ඝූර්ණයක් ඇති $MCl_3$ සහසංයුජ අණුව සාදයි. ආවර්තිතා වගුවේ M අයත් වන කාණ්ඩය වනුයේ,

(1) 2 (2) 13 (3) 14 (4) 15 (5) 16 **(2020)**

79. පහත දැක්වෙන ඒවායින් වැරදි ප්‍රකාශය හඳුනාගන්න.

(1) නයිට්‍රජන්වල [N(g)] ඉලෙක්ට්‍රෝන ලබාගැනීමේ ශක්තිය ධන වේ.

(2) $BiCl_3$ (aq) ද්‍රාවණයක් ජලයෙන් තනුක කරන විට සුදු අවක්ෂේපයක් දෙයි.

(3) $H_2S$ වායුවට ඔක්සිකාරකයක් සහ ඔක්සිහාරකයක් යන දෙආකාරයටම ක්‍රියා කළ හැක.

(4) He වල සංයුජතා ඉලෙක්ට්‍රෝනයකට දැනෙන සඵල න්‍යෂ්ටික ආරෝපණය ($Z^*$) 2 ට වඩා අඩු ය.

(5) ඉහල උෂ්ණත්වයකට රත් කළ වුවද ඇලුමිනියම්, $N_2$ වායුව කෙරෙහි නිෂ්ක්‍රිය වේ. **(2020)**

80. ජලීය $AgNO_3$ ද්‍රාවණයක් සමග අවක්ෂේපයක් ලබා දෙන්නේ මින් කුමක් ද?

a. $Ba(NO_3)_2$ b. NaOH c. KI d. $K_2Cr_2O_7$

81. තනුක $H_2SO_4$ සමග රත් කළ විට ආම්ලික වායුවක් ද, තනුක NaOH සමග රත් කළ විට භාෂ්මික වායුක් ද ලාබා දෙන්නේ පහත සඳහන් කුමන සංයෝගය / සංයෝග ද?

a. $Pb(NO_3)_2$ b. $(NH_4)_2CO_3$ c. $NH_4NO_2$ d. $(NH_4)_2SO_4$ **(2000)**

82. ජලීය $BaCl_2$ ද්‍රාවණයක් සමඟ අවක්ෂේප ලබා දෙන්නේ කුමන සංයෝගය / සංයෝගද?

a. $Na_2SO_4$ b. $Na_2CO_3$ c. $AgNO_3$ d. $Pb(CH_3C\,OO)_2$

83. මින් කුමක් කුමන ඒවා රත් කිරීමෙන් $NO_2$ ලැබේ ද?

a. $CsNO_3$ b. $Ba(NO_3)_2$ c. $Ni(NO_3)_2$ d. $NH_4NO_3$

84. $SO_2$ හා $CO_2$ එකිනෙකින් වෙන්කර හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැක්කේ පහත සඳහන් ඒවායින් කුමක්ද? / කුමන ඒවාද?

a. $Ba(OH)_2$ ද්‍රාවණයක් b. ලෙඩ් ඇසිටේට්වලින් තෙත් කරන ලද පෙරහන් කඩදාසියක්

c. $K_2Cr_2O_7$ ද්‍රාවණයක් d. රතු පැහැති මල් පෙති කැබැල්ලක් **(2002)**

85. තනුක HCl මගින් ආම්ලිකෘත ජලීය ද්‍රාවණ හතරක වෙන් වෙන් ව පවතින පහත දැක්වෙන අයන හතර අතරින්, ද්‍රාවණය තුළින් $H_2S$ යැවීමෙන් වෙන් කොට හඳුනා ගත **නොහැකි** අයන යුගලය කුමක් ද?

a. $Sb^{3+}$ b. $AsO_4^{3-}$ c. $AsO_3^{3-}$ d. $Cd^{2+}$ **(2004)**

86. $SO_2$ සහ $CO_2$ වෙන්කර හඳුනා ගැනීම සඳහා පහත සඳහන් ද්‍රාවණවලින් කුමන/කුමන ඒවා භාවිත කළ නොහැකි වේ ද?

a. $K_2Cr_2O_7/H^+$ b. $KMnO_4$ c. ලිට්මස් ද්‍රාවණය d. $FeCl_3/H^+$ **(2005)**

87. $AsO_3^{3-}$ සහ $SO_3^{2-}$ වෙන් කර හඳුනා ගැනීම සඳහා පහත සඳහන් කුමක් යොදා ගත හැකි ද?

a. $H_2S$ b. තනුක $H_2SO_4$ c. ආම්ලිකෘත $KMnO_4$ d. ලිට්මස් කඩදාසි **(2007)**

88. $NH_{3(g)}$ සම්බන්ධව පහත කුමන / ප්‍රකාශ **සත්‍ය** වේ ද?

a. $NH_3$ වලට ඔක්සිකාරකයක් මෙන්ම ඔක්සිහාරකයක් ලෙස ද ක්‍රියා කළ හැකිය.

b. මහා පරිමාණයෙන් $NH_3$ නිපදවීමට හේබර් (Haber) ක්‍රමය යොදාගැනීමේදී ඉහළ පීඩන හා ඉහළ උෂ්ණත්ව යටතේ $N_2$ හා $H_2$ භාවිත කෙරෙයි.

c. වැඩිපුර $Cl_2$ වායුවසමඟ $NH_3$ ප්‍රතික්‍රියා කළ විට $N_2O$ සහය HCl ඵල ලෙස ලැබේ.

d. රබර් කර්මාන්තයේදී රබර් කිරි නිසිකලට පෙර (premature) කැටි ගැසීම වැළැක්වීම සඳහා $NH_3$ භාවිත කෙරෙයි.

**(2012)**

89. කැටායන විශ්ලේෂණයේ දී, I කාණ්ඩයේ ලෝහ අයන ක්ලොරයිඩ ලෙස අවක්ෂේප කෙරේ. I කාණ්ඩය විශ්ලේෂණය පිළිබඳව මින් කුමන වගන්තිය / වගන්ති **සත්‍ය** වේ ද?

a. $Ag^+$ , $Hg^{2+}$ , $Hg_2^{2+}$ සහ $Pb^{2+}$ තනුක HCl එක් කිරීමේ දී අද්‍රාව්‍ය ක්ලෝරයිඩ සාදයි.

b. AgCl සහ $PbCl_2$ පමණක් ජලීය $NH_3$ හි ද්‍රවණය වී තනුක HCl එක් කිරීමේ දී නැවත අවක්ෂේප නොවේ.

c. තනුක HCl එක් කිරීමේ දී $Ag^+$ , $Hg_2^{2+}$ සහ $pb^{2+}$ පමණක් අද්‍රාව්‍ය ක්ලෝරයිඩය සාදයි.

d. උණු සාන්ද්‍ර HCl ද්‍රාවණයක $Pb^{2+}$ අවක්ෂේප නොවේ. **(2013)**

90. $H_2O_2$ පිළිබඳව මින් කුමන වගන්තිය/වගන්ති **අසත්‍ය** වේ ද?

a. $H_2O_2$ අණුවෙහි හිඩ්‍රොක්සයිල් කාණ්ඩ දෙක එකම තලයේ පිහිටයි.

b. ආම්ලික හා භාෂ්මික මාධ්‍ය දෙකෙහි දී ම $H_2O_2$ වලට ඔක්සිකාරකයක් සහ ඔක්සිහාරකයක් යන දෙක ම ලෙස ක්‍රියා කළ හැක.

c. සංශුද්ධ $H_2O_2$ , ශක්තිමත් ලෙස හයිඩ්‍රජන් බන්ධිත, අවර්ණ ද්‍රවයක් වේ.

d. $H_2O_2$ හි ඔක්සිජන් පරමාණු *sp* මුහුම්කරණය වී ඇත. **(2013)**

91. හැලජන පිළිබඳ ව පහත සඳහන් කුමන වගන්තිය/වගන්ති සත්‍ය වන්නේ ද?

(a) කාණ්ඩයේ පහළට හැලජනවල තාපාංක වැඩි වේ.

(b) අනෙකුත් හැලජන මෙන් නොව, ෆ්ලුවොරීන්ට $F_2$ හි හැර, අන් සැමවිටම (-1) ඔක්සිකරණ අවස්ථාව ඇත.

(c) සියලු ම හැලජන හොඳ ඔක්සිහාරක වේ.

(d) ආවර්තිතා වගුවේ සියලු ම මූලද්‍රව්‍ය අතරින් ෆ්ලුවොරීන් වඩාත්ම ප්‍රතික්‍රියාශීලි වන නමුත් එය නිෂ්ක්‍රිය වායු සමග ප්‍රතික්‍රියා නොකරයි. **(2018)**

92. 3d-ගොනුවේ මූලද්‍රව්‍ය සහ ඒවායේ සංයෝග පිළිබඳව පහත දැක්වෙන කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(a) 3d-ගොනුවේ මූලද්‍රව්‍ය අතුරෙන්, Sc ආන්තරික මූලද්‍රව්‍යයක් ලෙස නොසැලකේ.

(b) පරමාණුවල (Sc සිට Cu දක්වා) අරයන් වමේ සිට දකුණට අඩු වේ.

(c) $[Ni(NH_3)_6]^{2+}$ වල පාට නිල් වන අතර $[Zn(NH_3)_4]^{2+}$ අවර්ණ වේ.

(d) $K_2NiCl_4$ වල IUPAC නම වන්නේ dipotassium tetrachloronickelate(II). **(2020)**

93. හැලජන, උච්ච වායු සහ ඒවායේ සංයෝග පිළිබඳව පහත දැක්වෙන කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

(a) හයිපොක්ලෝරස් අයනය ආම්ලික ද්‍රාවණවල වේගයෙන් ද්විධාකරණය වේ.

(b) Xe , $F_2$ වායුව සමග සංයෝග ශ්‍රේණියක් සාදන අතර, ඒවා අතුරෙන් $XeF_4$ වලට තලීය සමචතුරස්‍රාකාර ජ්‍යාමිතියක් ඇත.

(c) හයිඩ්‍රජන් හේලයිඩ අතුරෙන් මවුලයක් සඳහා වැඩිම බන්ධන විඝටන ශක්තිය ඇත්තේ HF වලට ය.

(d) ලන්ඩන් බලවල ප්‍රබලතාව වැඩි වීම හේතු කොටගෙන හැලජනවල තාපාංක කාණ්ඩයේ පහළට වැඩි වේ. **(2020)**

| | |
|---|---|
| 94. නයිට්‍රජන්වලට ඔක්සිකාරයක් ලෙස ක්‍රියා කළ නොහැකි ය. | පිටතින් ඉලෙක්ට්‍රෝන ලබා ගැනීමට නයිට්‍රජන් පරමාණුව අපොහොසත් වේ. |
| 95. $NH_4Cl$ සහ $(NH_4)_2SO_4$ එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීම සඳහා හුණු දියර භාවිත කළ නොහැකි ය. | හුණුදියර සමඟ, $NH_4Cl$ සහ $(NH_4)_2SO_4$ යන දෙකම ඇමෝනියා ලබා දෙයි. |
| 96. $NH_3$ වලට ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කළ නොහැකිය. | $NH_3$ වල දී නයිට්‍රජන් ඔක්සිහරිත තත්වයක පවතී. |
| 97. නයිට්‍රික් අම්ලයට භෂ්මයක් ලෙස ක්‍රියා කළ නොහැකි ය. | නයිට්‍රික් අම්ලය $N_2O_5$ වලින් ව්‍යුත්පන්න වී ඇත. |
| 98. උත්ප්‍රේරක කිසිවක් නොමැතිව වාතයෙහි තිබෙන $N_2$ රසායනිකව $NH_3$ බවට පරිවර්තනය කළ හැකිය. | ඉලෙක්ට්‍රෝන ලබාගෙන අයන සෑදීමේ හැකියාව N පරමාණුවලට ඇත. |
| 99. නයිට්‍රජන් වායුව ඔක්සිජන් වායුවට වඩා අල්පතර වශයෙන් සක්‍රීය වේ. | නයිට්‍රජන් හි $2s^2p^3$ ඉලෙක්ට්‍රෝන සකස්වීම ඔක්සිජන්හි $2s^2p^4$ ඉලෙක්ට්‍රෝන සකස්වීමට වඩා ස්ථායී වේ. |
| 100. ඇමෝනියා වලට අම්ලයක් ලෙස ක්‍රියා කළ නොහැකිය. | නයිට්‍රජන් පරමාණුවේ තනි ඉලෙක්ට්‍රෝන යුගලක් ඇත. |
| 101..$NH_3$ හි තාපාංකය $PH_3$ හි තාපාංකයට වඩා වැඩිය. | $NH_3$ වල අණුක භාරය $PH_3$ වලට වඩා වැඩිය. |
| 102. නයිට්‍රජන් වායුවට ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කළ නොහැකිය. | නයිට්‍රජන් හි විද්‍යුත් ඍණතාව ඔක්සිජන් හි විද්‍යුත් ඍණතාවට වඩා අඩු ය. |
| 103. Mg(II) අයන අන්තර්ගත ජලීය ද්‍රාවණයකට $NH_4Cl$ හා $NH_4OH$ එකතු කළ විට, අවක්ෂේපයක් නො ලැබේ. | $Mg(OH)_2$ , $NH_4OH$ වල ද්‍රාවණය වේ. **(2000)** |

| | | |
|---|---|---|
| 104. $PCl_5$ පවතින නමුත්, $NCl_5$ නොපවතී. | ෆොස්පරස් පරමාණුව, නයිට්‍රජන් පරමාණුවට වඩා විශාල වේ. | **(2003)** |
| 105. වායුගෝලීය $O_2$ සමඟ ප්‍රතික්‍රියාව වැළැක්වීමට ෆොස්පරස් ජලය තුළ ගබඩා කරනු ලැබේ | ජලයෙහි දිය වූ $O_2$, ෆොස්පරස් සමඟ ප්‍රතික්‍රියා නොකරයි | **(2002)** |
| 106. $HNO_3$ ඔක්සිහරණය කළ හැකි නමුත් ඔක්සිකරණය කළ හැකිය. | $HNO_3$ ප්‍රබලතම ඔක්සිකාරකයන්ගෙන් එකකි. | **(2003)** |
| 107. භාෂ්මික ද්‍රාවණ සාදමින් ක්ෂාරීය ලෝහ ජලය සමඟ ප්‍රතික්‍රියා කරයි. | ක්ෂාරීය ලෝහ, ජලයෙන් හයිඩ්‍රජන් විස්ථාපනය කරයි. | **(2007)** |
| 108. $SO_2$ , විරංජන කාරකයක් ලෙස භාවිතකරන විට එය ඔක්සිකාරකයක් ලෙස ක්‍රියා කරයි. | විරංජන ක්‍රියාව සාමාන්‍යයෙන් ඔක්සිකරණ ක්‍රියාවලියක් වේ. | **(2008)** |
| 109. $CO_2$ සහ $SO_2$ වෙන්කොට හඳුනා ගැනීම සඳහා තෙත ලිට්මස් කඩදාසියක් භාවිත කළ නොහැකි ය. | $CO_2$ සහ $SO_2$ යන දෙකම ආම්ලික වායු වේ. | **(2009)** |
| 110. ජලීය ද්‍රාවණයකට $Pb(NO_3)_2$ ද්‍රාවණයක් එක් කළ විට කහ පැහැ අවක්ෂේපයක් ලැබේ නම්, එළැඹිය හැකි එකම නිගමනය වන්නේ $I^-$ අයන ඇති බවයි. | Pb සාදන, ජලයේ අද්‍රාව්‍ය කහපැහැති එකම සංයෝගය $PbI_2$ වේ. | **(2012)** |
| 111. ඝන සල්ෆර්, උණු සාන්ද්‍ර $H_2SO_4$ සමග ප්‍රතික්‍රියා කර $SO_3$ සහ $H_2O$ ලබාදෙයි. | උණු සාන්ද්‍ර $H_2SO_4$ විජලකාරකයක් ලෙස ක්‍රියා කරයි. | **(2014)** |
| 112. Na සමඟ $NH_3$ ප්‍රතික්‍රියා කර ඵලයක් ලෙස $H_2$ ලබා දෙන අතර $Cl_2$ සමඟ $NH_3$ ප්‍රතික්‍රියාකර ඵලයක් ලෙස $N_2$ ලබා දෙයි. | $NH_3$ ඔක්සිකාරකයක් මෙන් ම ඔක්සිහාරකයක් ලෙස ද ක්‍රියා කරයි. | **(2014)** |
| 113. ජලය හමුවේ දී $NCl_3$ වලට විරංජනකාරකයක් ලෙස ක්‍රියා කළ හැක. | $NCl_3$ ජලය සමග ප්‍රතික්‍රියා කර $NH_3$ සහ HOCl ලබා දෙයි. | **(2015)** |
| 114. සල්ෆර් සහ NaOH අතර ප්‍රතික්‍රියාව ද්විධාකරණ ප්‍රතික්‍රියාවකට උදාහරණයකි. | මූලද්‍රව්‍යයක් එකවර ම ඔක්සිකරණය සහ ඔක්සිහරණය වන විට එය ද්විධාකරණය ලෙස හැඳින්වේ. | **(2015)** |
| 115. සුක්‍රෝස්, සාන්ද්‍ර $H_2SO_4$ සමඟ පිරියම් කළ විට කළු පැහැති ස්කන්ධයක් ලැබේ. | සාන්ද්‍ර $H_2SO_4$ ප්‍රබල ඔක්සිකාරකයකි. | |
| 116. කාණ්ඩයේ පහළට යන විට ජලය සමඟ ක්ෂාර ලෝහවල ප්‍රතික්‍රියතාව වැඩිවේ. | ලෝහ පරමාණුවේ විශාලත්වය වැඩි වන විට ප්‍රබල ලෝහක බන්ධන සෑදේ. | **(2016)** |
| 117. $MgCO_3$ වලට වඩා $BaCO_3$ තාපස්ථායි වේ. | දෙවන කාණ්ඩයේ කැටායනවල ධ්‍රැවීකරණ බලය කාණ්ඩයේ පහළට යන විට අඩු වේ. | **(2018)** |
| 118. හැලජන අතුරෙන්, $I_2$ ඝනයක් වන අතර $Br_2$ ද්‍රවයකි. | අණුක පෘෂ්ඨීක වර්ගඵලය වැඩිවීමත් සමග ලන්ඩන් බල වඩා ප්‍රබල වේ. | **(2019)** |
| 119. Cr සහ Mn හි ඔක්සයිඩ අතුරෙන්, CrO සහ MnO ආම්ලික වන අතර, $CrO_3$ සහ $Mn_2O_7$ භාස්මික වේ. | Cr සහ Mn වල ඔක්සයිඩවල ආම්ලික/භාස්මික ස්වභාවය, ලෝහයේ ඔක්සිකරණ අංකය මත රඳා පවතී. | **(2020)** |

(2021 Theory)